# එයාර්ටෙල් CMO ආසියානු සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයකින් පිදුම් ලබයි.

මානව සම්පත් සහ සන්නාම නායකත්ව නව්‍යකරණයට ඉහළම පිළිගැනීමක්

මානව සම්පත් සංවර්ධන සම්මේලනය මගින් හොඳම සේවායෝජක සම්මානය පිරිනමයි.

ශ්‍රී ලංකාවේ වේගවත්ම සහ තරුණ ප්‍රජාවේ ජනප්‍රියතම දුරකථන සන්නිවේදන ජාලය වන එයාර්ටෙල් ලංකා තම කීර්තිය තවදුරටත් තහවුරු කරමින් 2019 CMO ආසියානු සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයකින් පිදුම් ලැබීමට සමත් විය.

ලෝක අලෙවිකරණ සම්මේලනය මගින් පිරිනැමූ "ශ්‍රී ලංකාවේ සන්නාම නායකත්ව" සම්මානයට අතිරේකව ලෝක මානව සම්පත් සම්මේලනය මගින් පිරිනැමූ හොඳම සේවායෝජක සම්මානයෙන් පිදුම් ලැබීමටද එයාර්ටෙල් ලංකා සමාගම සමත් විය.එසේම ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද (FSE) Field Sales Executive වැඩසටහනද ප්‍රශංසාවට ලක්වූ අතර රඳවා ගැනීමේ උපායමාර්ගයේ හොඳම නවෝත්පාදනය සඳහා වන සම්මානය ඒ සඳහා හිමි විය.

මේ පිළිබඳව අදහස් දක්වන භාරති එයාර්ටෙල් ලංකා හි ප්‍රධාන විධායක නිලධාරී සහ කළමණාකාර අධ්‍යක්ෂ ජිනේෂ් හෙජ් මහතා," එයාර්ටෙල් ලංකා හි අපගේ අංක එකේ ප්‍රමුඛතාව වන්නේ පාරිභෝගික තෘප්තිය සහ ආයතනය සමග පාරිභෝගිකයාගේ සමීප බවයි. මේ සියලු ඉලක්කයන් ඵලදායී අලෙවිකරණයකින් සහ උද්යෝගීමත් කණ්ඩායමකින් තොරව කල නොහැක්කක්.ශ්‍රී ලංකාවේ වේගයෙන්ම වර්ධනය වන දුරකථන සන්නිවේදන ජාලය ලෙස අද අපි ලබා තිබෙන මෙම ජයග්‍රහණයට ප්‍රධාන හේතුව වන්නේ අපගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් කරන ලද ආයෝජනය, පාරිභෝගිකයන් අවබෝධ කරගැනීම සහ ඵලදායී සන්නිවේදනයයි.එයාර්ටෙල් හී සිදුවන දැවැන්ත වර්ධනයන් සමග අපගේ පාරිභෝගිකයන්ට වඩා වැඩි වටිනාකමක් ඉදිරියේදී ලබා දීමට අපට හැකිවන බව විශ්වාසයි යයි "ඔහු පවසයි.

ශ්‍රී ලංකා හොඳම සේවායෝජක සන්නාම සම්මාන උළෙල යනු ගෝලීය සේවායෝජක සන්නාම ලෝක මානව සම්පත් සංවර්ධන සමුළුවට සමගාමීව කලාපීය වශයෙන් වාර්ෂිකව පවත්වන සම්මාන උළෙලක් වේ. මෙහිදී සම්මාන ලාභීන් සම්මාන සඳහා අයදුම් නොකරන අතර ක්ෂේත්‍රයේ දක්වන්නාවූ කුසලතා පිලිබඳ විශ්ලේෂණාත්මක ඇගයීමකින් පසු සම්මාන පිරිනමයි.එහිදී රැකියා තෝරාගැනීම,රැකියා ස්ථාපනය සහ පුහුණු කිරීම යනාදී කැරුණු ඇගයීමට ලක් කරයි.

එහිදී නව්‍ය සන්නාම අලෙවිකරණ සහ සන්නිවේදන උපාය මාර්ගයන් යොදා ගනිමින් සහ ආයතනික වටිනාකම් සමග මුසුවෙමින් ධනාත්මක සමාජ වෙනස්කමක් ඇති කරන සමාගම් සඳහා මෙම සම්මාන පිරිනමනු ලබයි. මෙම සම්මාන විශේෂ ජූරි සභාවක් මගින් ඇගයීමට ලක්කරන අතර "ලෝක ආයතනික සමාජ වගකීම් දිනය සංවිධානය " සහ ලෝක වෘත්තීය අලෙවිකරණ ලෝක සමුළුව යන සංවිධානයන්හී පර්යේෂණ සහය ද මේ සඳහා ලබා ගනී.

මෑතක සිට ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතර එයාර්ටෙල් හී ජනප්‍රියතාව ඉතා සීග්‍රයෙන් ඉහළ ගොස් තිබේ.විශේෂයෙන් මිලේනියල්ස් (Millennials) සහ ජෙන් ඉසඩ් (Gen Z) පරම්පරාවන් හී අවශ්‍යතාවයන්ට ගැලපෙන සන්නිවේදන පැකේජයන් හඳුන්වා දීම සහ ශ්‍රී ලංකා තාරුණ්‍යයේ සැඟවුණු දක්ෂතා සොයා යන වේගවත්ම පන්දු යවන්නා මෙහයුම යන වැඩසටහන් ද මෙම ජනප්‍රියත්වයට ප්‍රධාන හේතුව වී ඇත.

ශ්‍රී ලංකාවේ සේවය කල හැකි හොඳම සේවාස්ථාන 25 අතරට ශ්‍රේණිගත වීමට එයාර්ටෙල් ලංකා සමාගම පසුගියදා සමත් විය.Great Places to Work ආයතනය මගින් පිරිනැමූ මෙම සම්මානය ,එයාර්ටෙල් ලංකා හී සජීවී බව ,සියලු දෙයින් සම්පූර්ණ බව .ගෞවරවනීය බව යන කරුණු මුල්කරගනිමින් ලබා දුන් අතර එයාර්ටෙල් ලංකා හී ක්ෂේත්‍ර අලෙවි විධායකයින් ගේ කැපවීම ද මේ සඳහා හේතු විය.පසුගිය වසර දෙක තුළ පුහුණුව සහ අලෙවිකරණ ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා එයාර්ටෙල් ලංකා විශාල ආයෝජනයක් සිදු කර ඇති අතර වෘත්තීය සංවර්ධන අවස්ථා පුළුල් කර තිබේ.

2009 දී ශ්‍රී ලංකාවේ මෙහෙයුම් ආරම්භ කළ භාරතී එයාර්ටෙල් පාරිභෝගිකයින් මිලියනයක් වෙත ලඟා වී ඇති ලංකාවේ ක්‍රියාත්මක වේගවත්ම සන්නිවේදන ජාලය වේ.ආසියාවේ ප්‍රමුඛතම ජංගම දුරකථන සන්නිවේදන ජාලය වන භාරති එයාර්ටෙල් ජංගම දුරකථන ග්‍රාහකයින් මිලියන 100 කට අධික පිරිසක් වෙත තම සේවය ලබා දෙයි.එය ලෝකයේ හොඳම කාර්යසාධන සමාගම් 50 අතරට ලෝකයේ ඉහළම පිළිගැනීමක් ඇති "ෆෝබ්ස් ව්‍යාපාරික සඟරාව මගින් Asia's Fab 50 list හී ශ්‍රේණිගත කර තිබේ.

CMO ඒෂියා සංවිධානය පූර්ණ කාලීන වෘත්තිකයන් විසින් පවත්වාගෙන යන සංවිධානයක් වන අතර ක්ෂේත්‍රයේ නවතම දැනුම , ජ්‍යෙෂ්ඨ අලෙවිකරණ නිලධාරීන් සහ සන්නාම තීරණ ගන්නන් අතර හුවමාරුකර ගැනීම,දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීම සහ අලෙවිකරණ වෘත්තිකයන් දිරිමත් කිරීමට කැපවී සිටිති. CMO Asia මෙම ජාලය තුළින් ආසියාවේ කර්මාන්ත අංශයන්හි තීරණ ගන්නන් අතර ඉහළ මට්ටමේ චින්තන නායකත්වයක් සහ සම කණ්ඩායම් ජාලයක් ඇති කිරීමට අරමුණු කරයි.

අවසානයි.

භාරති එයාර්ටෙල් ලංකා පිලිබඳව

වර්ෂ 2009 ජනවාරි 12 වන දින ශ්‍රී ලංකාවේ මෙහයුම් ඇරඹූ භාරති එයාර්ටෙල් (එයාර්ටෙල් ලංකා ) පාරිභෝගිකයන් මිලියනයක් කරා ලඟා වී සිටින ශ්‍රී ලංකාවේ වේගවත්ම සන්නිවේදන ජාලය වේ.තම වාණිජ මෙහයුම් ඇරඹූ 2009 වර්ෂයේ සිට වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළ එයාර්ටෙල් ලංකාවේ සෑම ප්‍රදේශයක් කරාම ව්‍යාපත් වූ අතර අද වන විට මුළු දිවයිනම ආවරණය කරනු ලබයි.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති එයාර්ටෙල් ලංකා දුරකථන අන්තර්ජාල සේවාවන් සහ

ආයතනික විසඳුම් ඇතුළු  ඩිජිටල් ජංගම දුරකථන සේවාවන් රාශියක් පිරිනමයි.වැඩි විස්තර සඳහා " www.airtel.lk” වෙත පිවිසෙන්න.